778 ඉත්තපාන උතුර ග්‍රාම නිලධාරී වසම

හැඳින්වීම

පොදු පහසුකම් උෆණ ග්‍රාම නිලධාරී වසම් 60 ක් අතුරින් 778 ඉත්තපාන උතුර ග්‍රාම නිලධාරී වසම වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ එක් වසමකි. මුළුමනින්ම ග්‍රාමීය ස්වාභාවයක් ගනී. උතුරින් 778 ඒ මිරිස්වත්ත ග්‍රාම නිලධාරී වසමින් ද නැගෙනහිරින් 779 හල්වල ගඋම නිලධාරී වසමින්ද දකුණින් 777 ඒ ඉත්තපාන බටහිර ග්‍රාම නිලධාරී වසමින්ද 778 සි මාළඹේහේන ග්‍රාම නිලධාරී වසමින්ද බටහිරින් මතුගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන්ද වසම මායිම් වී පවතී. ප්‍රදේශයේ ප්‍රධාන ආර්ථික භාගය වන්නේ තේ වගාවයි.

වසමට යන ගමන් මාර්ගය

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිට

වලල්ලාවිට සිට අවිත්තාව දෙසට යන විට අවිත්තාව මංසන්ධිය හමු වේ. අවිත්තාව අළුත්ගම ප්‍රධාන මාර්ගය දිගේ 15 km පමණ ඉදිරියට පැමිණීමේදී මල්ලිවත්ත හන්දිය හමු වේ. මල්ලිවත්ත හන්දියෙන් දකුණු පසට පැමිණෙද්දි 778 ඉත්තපාන උතුර ග්‍රාම නිලධාරී වසම හමු වේ.

වසමට අයත් කලාප

වසමට අයත් කලාපය	- ඉත්තපාන
පොලිස් බල ප්‍රදේශය	- වැලිපැන්න
අධ්‍යාපන කලාපය	- මතුගම
ගොවිජන සේවා කාර්යාලය	-ඉත්තපාන
සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය	- ඉත්තපාන
සමෘද්ධි කලාපය	- ඉත්තපාන

වසමෙහි නම සැදුනු ආකාරය

කෝට්ටේ සහ පාලින්ද නුවර ප්‍රාදේශිය රාජකාරී පැවති යුගයේ සිට මෙම ප්‍රදේශවල ජනතාව ජීවත් වූ බව ඉතිහාසයේ සඳහන් වේ. ඉත්තපාන ශ්‍රී සුදර්ශනාරාම විහාරයේ විහාරාධිපතිව සිට 2001 වර්ෂයේ අපවත් වී වදළ පූජ්‍ය පත්බේරියේ ඉන්ද්‍රානන්ද ස්වාමීන් වහන්සේ ලියූ පස්යොදුන් රට ඉතිහාසය නැමැති කෘතියේ සඳහන්වන ආකාරයට වීදිය බණ්ඩාර නැමැති සෙනෙවියා පාලින්ද නුවර සිට සේනා සංවිධානය කර බෙන්තර ගඟ හරහා සේනාව රැගෙන යුද්ධයට ගොස් ඇත.

ප්‍රදේශයේ වැඩිහිටි ජනතාව සඳහන් කරන ආකරයට ඉත්තපාන ශ්‍රී සුනන්දරාම විහාරස්ථානය අසල ඉදිරිපස ඉඩමක කළු ගලක් තිබූ අතර එම ගලෙහි ඉත්තෑවෙක් සිට ඇත. ජනතාව එම ඉත්තෑවා පැන්නීමට උත්සහ කළද එය අසාර්ථක ප්‍රයත්නයක් වූ බැවින් පහනක් පත්තු කර ඇත. ඒ අනුව ඉත්තෑවා පැන්නීමට පහනක් පත්තු කල බැවින් ඉත්තපාන වශයෙන් ප්‍රදේශය හඳුන්වා ඇත.

වසමේ භූමියේ ස්වාභාවය

වගුරු බිම්, තැනිතලා, කඳු සහිත ස්වාභාවයක් පවතී.

පසේ ස්වභාවය

වැලි පස සහ මැටි පස දක්නට ලැබේ.

ජනග්‍රහන තොරතුරු

ජාතිය	ස්ත්‍රී	පුරුෂ
සිංහල	609	565
දෙමළ	02	02
මුස්ලිම්	-	-
වෙනත්	-	-
එකතුව	611	567

ආගම් අනුව

ආගම	ස්ත්‍රී	පුරුෂ
බෞද්ධ	607	563
ශින්දු	02	02
ක්‍රිස්තියානි	02	02
ඉස්ලාම්	-	-
වෙනත්	-	-
එකතුව	600	567

විශේෂ හැකියා ඇති පුද්ගලයන්

H.D..ඩඩ්ලි සසන්ත, කැඩුම් බිදුම් දේශිය වෛද්‍ය ප්‍රතිකාර- 071 7284000

උසස් අධ්‍යාපනය ලබන දරුවන් ගණන

ස්ත්‍රී - 120

පුරුෂ - 122